# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 54 — 1973 අප්‍රේල් 06 වැනි සිකුරාදා — 1973.04.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| පනත් ... | (අතිරේක) |
| ශ්‍රී ලංකා ඇපල් මහාධිකරණයේ දන්වීම — ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 57 |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දන්වීම ... | 57 |
| මිස්තු හංගත්ව නඩු පිළිබඳ දන්වීම ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම — — | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම — — | 57 |
| බූදල් නඩු පිළිබඳ දන්වීම ... — — | 60 |
| නීති අධ්‍යාපන සභාවේ දන්වීම ... — — | — |
| නොතාරිස් ලැයිස්තුව ... — — | — |
| විවිධ දන්වීම ... ... — — | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන් අග්‍ර විනිශ්චයකාර ධූරන්ධර හියු නෝර්මන් ග්‍රෙගරි ප්‍රනාන්දු වන මම, මා හට සෑහෙන කරුණු පෙනී ගියෙන්, 1973 පෙබරවාරි මස 24 වැනි දින අංක 48/1 දරණ (අතිවිශේෂ) ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කර තිබූ මාගේ නියෝගය අනුව, 1973 අප්‍රේල් මස 9 වැනි දින ඇරඹීමට නියමිතව ඇති පළමුවෙනි නැගෙනහිර චාරිකාවේ මඩකලපුව අපරාධ අධිකරණ සැසිවාරය, එදිනට නොව, 1973 අප්‍රේල් මස 30 වෙනි සඳුදින පැවැත්වීමට නියෝග කරමි.

එච්. එන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1973 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

4–114—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දන්වීම

### හැටන් මහේස්ත්‍රාත් උසාවියේ පැරණි නඩු පොත් විනාශ කිරීම

1946.5.21 දින සිට 1973.3.5 දින දක්වා හැටන් මහේස්ත්‍රාත් උසාවියේදී තීන්දු කරන ලද අංක 8501 සිට 11620 දක්වා වූ නඩු පොත් (336 වන අධිකාරය වන) නොවටිනා ලිපි ලේඛන විනාශ කිරීමේ ආඥාපනතේ 5 වන වගන්තියේ විධිවිධාන යටතේ විනාශ කරනු ලබන බවට තුන් මසක දැනුම් දීමයි.

ඉහත සඳහන් දරන නඩු පොත් ගැන උනන්දුවක් දක්වන පුද්ගලයින් වෙතොත් පෞද්ගලිකව හෝ නීතිඥ තැන මගින් හෝ විධිමත් සත්‍ය පෙත්සමකින් හෝ ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කළ යුතුය. එවිට එබඳු නඩු පොත් විනාශ කරනු නොලැබේ.

එල්. ඒ. ගුණවර්ධන,
මහේස්ත්‍රාත් තැන,
හැටන්.

හැටන්, මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

4–84—73.04.06 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම

### බස්නාහිර පළාත

#### ගම්පහ දිස්ත්‍රික් නඩුශාලාවේදීය

කොළඹ 15, මෝදර, ධම්මසිංහාරාම පාරේ අංක 135/5 දරණ ස්ථානයේ පදිංචි රන්කරු බඩල්ගේ සෙලෙස්තීනු පෙරේරා ............................................ පැමිණිලිකාරයා.

නොම්මරය : 15598/උගස් එදිරිව

කඩවත, පහල බියන්විල පදිංචි මූදිරන් ගල ආරච්චිගේ ලියනෝරා ............................................ විත්තිකාරිය.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරියට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1973ක් වූ මැයි මස 4 දින පෙ. ව. 10 පැයට ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. විකිණීමේ නියෝගය අනුව විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු මුදල වන රු. 3107.33 ක් ද වර්ෂ 1969 ඔක්තෝබර් මස 31 වෙනි දින සිට මුල් මුදල රු. 2,000 සඳහා නඩු තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් එනම් 1971.3.20 වෙනි දින තෙක් සියයට 12 බැගින්

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දන්වීම් බාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

57—බී 70852 — 5,682 (73/3)

68. හො. 20 කිරිය හැකි ඇවරි තරාදි 1 යි.
69. තද කරන යන්ත්‍ර 1 යි.
70. අත් කරත්ත 2 යි.
71. ගලවන ලද රාක්ක 1 යි.
72. හෝස් පයිප්ප 3 යි.
73. බවුසර් ටැන්කි 1 යි.
74. හිස් බැරල් 25 ක් පමණ.
75. පරණ බුයර් 1 යි.
76. පරණ පුලීස් 3 යි.
77. පරණ ලියන මේස 2 යි.
78. පරණ ලී ටිකක්.
79. ටකරන් 2 යි.
80. ලොරි වැයි 1 යි.
81. පරණ බැරල් 11 යි.
82. කාබයිඩ් ටැන්කි 1 යි.
83. මැෂින්වල කොටස් ටිකක්.
84. රවුන් තවන මැෂින් 2 යි.
85. ගැල්වනයිස් ටැන්කි 1 යි.
86. රවුන් තවන මැෂින් එකක කොටස්.
87. පරණ පරාල සියයක් පමණ.
88. හො. 20 කිරිය හැකි ඇවරි තරාදි 1 යි.
89. ගැල්වනයිස් ටැන්කි 5 යි.
90. පරන ටැන්කි 1 යි.
91. පරන ටැන්කි 1 යි.
92. තෙල් ටැන්කි ලොකු 2 යි.
93. ටකරන් සෙවිලි කරන ලද මඩු 1 යි.
94. ටකරන් සෙවිලි කරන ලද මඩු 1 යි.
95. පරණ ටකරන් සෙවිලි කරන ලද මඩු 1 යි.
96. පරණ ටකරන් සෙවිලි කරන ලද මඩු 1 යි.
97. පරණ ටකරන් සෙවිලි කරන ලද මඩු 1 යි.
98. ඇන්ජින් කිසිත් නැති පරන වැයි 1 යි.
99. අලුත් ඉන්ටර් නැෂනල් මොඩල් 1400 R 175 (සම්පූර්ණ රෝද, බැටරි, ඩයිනමෝ ආදිය නැති) ලොරි 1 යි.
100. අලුත් ඉන්ටර් නැෂනල් මොඩල් L 785030 (සම්පූර්ණ රෝද, බැටරි, ඩයිනමෝ ආදිය නැති) ලොරි 1 යි.
101. වැයි කද සහ ලොරි බොඩි 1 යි.
102. ටකරන් සෙවිලි කරන ලද ගැරේජ් මඩු 1 යි.
103. පරණ වැයි කදන් 1 යි.
104. කොටස් ගලවන ලද පරන රස්ටන් ඇන්ජින් 1 යි.
105. වතුර පොම්ප 1 යි.
106. කැරකෙන මේස පුටු 2 යි.
107. යකඩ සේප්පු 1 යි.
108. ලියන මේස 24 යි.
109. ලාච්චු 2 යකඩ කැබිනට් 7 යි.
110. ලාච්චු 4 යකඩ කැබිනට් 3 යි.
111. යකඩ ලියන මේස 1 යි.
112. වතුර පිල්ටර 1 යි.
113. උස යකඩ කැබිනට් 2 යි.
114. දිග කවුන්ටර් 1 යි.
115. යකඩ පුටු 2 යි.
116. පුටු 15 යි.
117. සවි කරන ලද විදුලි පංකා 5 යි.
118. දිග රාක්ක 7 යි.
119. සැන් තෝමස් බිත්ති ඔරලෝසු 1 යි.
120. යතුරු ලියන එකයි.
121. මේස ට්‍රේස් 19 යි.
122. ජී. ඕ. එච්. පුටු 10 යි.
123. රවුන් ටිපෝ 1 යි.

6. එමගම ගාලුපියද්දේ පිහිටි මීරලෙබ්බෙගෙවත්ත නොහොත් ආරච්චිගේවත්ත කියන ඉඩමේ බිමෙන් සහ ගස්වලින් නොබෙදූ 1/8+ 1/144+ 5/72+ 5/1296+ 1/72+ 1/1296+ 3/4න් 1/2න් 7/24ක් සහ මීරලෙබ්බෙගේවත්ත නොහොත් ආරච්චිගේවත්ත නොහොත් බදුවත්ත නමැති ඉඩමේ පිහිටි පාඨශාලා හැඩය ඇති අඩි 31 අඟල් 11 දිගද, අඩි 14 අඟල් 8 ක් පළල ඇති බැම්මෙන් බැඳ උලු සෙවිලි කර ඇති ගෙඩනැගිල්ල ද, පිටත බිත්තිය උසින් බාගෙට බැඳ ඇත. මායිම් :— උ: ආනමාලුකොරටුව සහ සේගුනම්බිගෙ වත්ත, නැ: බම්බගල ඇල අද්දර වෙල, ද: ගෙදර වත්ත, බ: පත්සේකර ගේවත්ත. බිම් ප්‍රමාණය ඔප්පු අවේම එකතුව අ. 4, රූ. 0, පර්. 12 ක් වේ. මෙම ඉඩමට අයිවන් ජයසේකර නොතාරිස් මහතා 1947.2.24 වන දින සහතික කර ඇති 1232 ඔප්පුවේ බැඳ ඇති බිබී මිතින්දෝරු මහතා ගේ අංක 142 දරණ ප්ලෑනයේ ද, ඒ. ඇම්. ඇම්. නාහිර් නොතාරිස් මහතා විසින් 1947.3.30 දින දරණ 2341, 1947.3.31 දරණ 2343 සහ 1949.1.20 දින දරණ 2587 දරණ ඔප්පුවල සඳහන් පරිදි ය. ලියා පදිංචි අංකය ඒ. 256/251 සහ ඒ. 256/123 වේ. මෙය නුගදූව ගිනිකූරු මෝල නමින් ඇති සියලු ඇන්ජින් සහ මැෂින් ද වේ.

### 1973.4.28 වන දින විකුණනු ලබන අංක 6ඒ. දරණ වංවල දේපල ලැයිස්තුව

1. අංග සම්පූර්ණ බොයුලේරුව සමග ගිණිකූරු වේලන මැෂින් 2 යි.
2. පෙට්ටි සාදන මැෂින් 5 යි.
3. ගිණිකූරු බෙහෙත් කලවම් කරන මැෂින් 1 යි.
4. බන්කු 1 යි.
5. කපන යන්ත්‍ර 2 යි.
6. මේසයක් සහ පෙට්ටියක්.
7. අංක 13594 දරණ බ්ලැක් ස්ටෝන් වර්ගයේ ටැන්කිය සමඟ තෙල් ඇන්ජින් 1 යි.
8. කපන යන්ත්‍ර 1 යි.
9. හලීමා සහ ඇම්. ජේ. කපන මැෂින් 2 යි.
10. ගිණිකූරු යන්ත්‍ර 4 යි.
11. පරන යකඩ ගිණිකූරු ස්ටැන්ඩ් 13 ක් පමන.
12. කුඩා දඬු අඩුව හා සවිකර ඇති මේසය.
13. ගිණිපෙට්ටි අච්චු යන්ත්‍ර 2 යි.
14. ඉටි උණුකරන ප්ලේට් එක සහ බොයිලේරුව.
15. ගිණිකූරු බෙහෙත් තබන තැටිය.
16. බෙහෙත් ගාපු ගිණිකූරුතැටි සියයක් පමණ.
17. ගිණිකූරු එකතු කරන යන්ත්‍ර 1 යි.
18. ගිණිකූරු පිරිසුදු කරන යන්ත්‍ර 1 යි.
19. ඩයිනමෝ 1 යි.
20. ගිණිකූරු බෙහෙත් අඹරන යන්ත්‍ර 1 යි.
21. ලේබල් අලවන යන්ත්‍ර 1 යි.
22. මෝටර් එකක පැන් 1 යි.
23. ගිණිකූරු කපන මැෂින් 1 යි.
24. බන්කු 5 ක් සහ මේස 2 ක්.
25. ලී රාක්ක 1 යි, කබර්ඩ් 2 යි.
26. ගලවාපු යන්ත්‍ර කොටස් ටිකක්.
27. පුලි 9 සහිත කනු 9 පිට සවිකර ඇති දිග ෂාප් 1 යි.
28. පුලි 2 ක් සහිත ෂාප් 1 යි.
29. පුලි 3 ක් සහිත කනු 3 පිට සවිකර ඇති ෂාප් 1 යි.
30. පුලි 3 ක් සහිත කනු 2 පිට සවිකර ඇති ෂාප් 1 යි.
31. පුලි 4 ක් සහිත දිග ෂාප් 1 යි.
32. හිස් ගිණිකූරු රාමු 30 ක් පමණ.
33. ගිණිකූරු අමුණා ඇති රාමු 30 ක් පමණ.
34. හිස් ගිණිකූරු පෙට්ටි ටිකක්.
35. තාච්චි 1 යි.
36. ගිණිකූරු ට්‍රේස් 25 ක් පමණ.
37. මේසයක්, පුටුවක්.
38. ලියන මේස 4 ක් සහ පුටු 9 ක්.
39. පරණ බිත්ති ඔරලෝසුවයි.
40. අල්මාරි 1 යි.
41. සවිකර ඇති විදුලි පංකා 1 යි.
42. ප්‍රථමාධාර බෙහෙත් පෙට්ටියක් සහ රාකකුයක්.
43. ඇවරි තරාදියක් සහ පඩි 7 ක්.
44. ලොකු බැරල් 4 යි, පොඩි 7 යි.
45. ගිණි නිවන ටැන්කි 5 යි.
46. විදුලි පංකා දෙකක කොටස්.
47. තරාදි පඩි 5 යි.
48. ඇසිඩ් බෝතලයක්.
49. ස්ක්‍රීන් 1 යි.
50. ඇස්බැස්ටෝස් සවිකර ඇති මඩු 1 යි.
51. බවුසර් ටැන්කි 1 යි.
52. වතුර ටැන්කි 1 යි.
53. දර කොටන් 12 ක් පමණ.

### 1973.4.30 දින පෙ. ව. 10 ට විකුණනු දේපල

7. ඉහත කී ගාලු පියද්දේ නුගදූව පිහිටි බඹගල ඇල අද්දර විල නමැති බෙදා වෙන් කරන ලද ඉඩමේ ලොට් අංක 2 දරණ කැබැල්ලේ සියලු ගෙඩනැගිලි, ගහකොල පලතුරු සහිත බිම වේ. මායිම් උතුරට: අකුරැස්ස දක්වා දිවෙන මහපාර, නැගෙනහිරට: එම ඉඩමේ ලොට් 3 දරණ කැබැල්ල, දකුණට: පුංචිදූවේ කුඹුර, බටහිරට: පින්වත්ත නොහොත් බදු වත්ත. බිම් ප්‍රමාණය :අ. 1, රූ. 1, පර්.18.6 ක් වේ. අංක ඒ 284/276 යටතේ ගාල්ලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

8. ඉහත කී ගාලු පියද්දේ නුගදූව පිහිටි බඹගලඇල අද්දරවිල නමැති බෙදා වෙන් කරන ලද ඉඩමේ ලොට් අංක 4 දරණ කැබැල්ලේ සියලු ගොඩනැගිලි ගහකොල පලතුරු සහිත බිම් වේ. මායිම් :— ඊසාන දිගට: ආසිතම්බිගේ කුඹුර, මහවිල, නැගෙනහිරට: එම ඉඩමේ ලොට් 5 දරණ කැබැල්ල, දකුණට: අකුරැස්ස දක්වා දිවෙන මහපාර, නිරිතට: ලොට් 1 දරණ කැබැල්ල සහ වයඹට: වලහන් දූවට යන පාර. බිම් ප්‍රමාණය: අ. 0, රූ. 1, පර්. 23.5 ක් වේ. අංක ඒ 284/277 යටතේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

9. ඉහත කී ගාලු පියද්දේ නුගදූව පිහිටි බඹගල ඇල අද්දරවිල නමැති බෙදා වෙන් කරන ලද ඉඩමේ ලොට් අංක 5 දරණ කැබැල්ලේ සියලු ගොඩනැගිලි, ගහකොල පලතුරු සහිත බිමෙන් නොබෙදූ දෙකෙන් කොටසක් වේ. මායිම්: ඊසානදිගට: ආසිතම්බිගේ මහවිල, නැගෙනහිරට: බඹගල ඇල, දකුණට: අකුරැස්ස දක්වා දිවෙන මහ පාර, බටහිරට: එම ඉඩමේ ලොට් අංක 4 දරණ කැබැල්ල. බිම් ප්‍රමාණය: අ. 0, රූ. 1, පර්. 34.5 ක් වේ. අංක ඒ 284/283 යටතේ ගාල්ලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමඟ කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 01 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 01 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කොළවලරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.01 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | මෙරට රු. | මෙරට ශ. | | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|---|---|---|
| එක් කොටසක් | ... | ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | ... | ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | ... | ... | 43 | 50 | ... | 51 | 50 |

වර්ෂයේ අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | මිළ රු. | මිළ ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් | ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් | ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර අලුතින් එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට ගැනෙන වේලාවන් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍ර පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 73. 03. 02 | සිකුරාදා ... | 73. 02.23 | සිකුරාදා | දවල් 12.00 |
| | 73. 03. 09 | සිකුරාදා ... | 73. 03.02 | සිකුරාදා | දවල් 12.00 |
| | 73. 03. 16 | සිකුරාදා ... | 73. 03.09 | සිකුරාදා | දවල් 12.00 |
| | 73. 03. 23 | සිකුරාදා ... | 73. 03.16 | සිකුරාදා | දවල් 12.00 |
| | 73. 03. 30 | සිකුරාදා ... | 73. 03.23 | සිකුරාදා | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 04. 06 | සිකුරාදා ... | 73. 03.30 | සිකුරාදා | දවල් 12.00 |
| | 73. 04. 11 | බදාදා ... | 73. 04.06 | සිකුරාදා | දවල් 12.00 |
| | 73. 04. 19 | බ්‍රහස්පතින්දා ... | 73. 04.11 | බදාදා | දවල් 12.00 |
| | 73. 04. 27 | සිකුරාදා ... | 73. 04.19 | බ්‍රහස්පතින්දා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.